www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලාංකික වෘත්තීය සමිති පාලක ප්‍රභුවේ ජනාධිපති අපේක්ෂකයන්ට සහාය දෙයි

## Sri Lankan unions rally behind presidential candidates of ruling elite

**එස්. අජන්තන් විසිනි**

**2009 දෙසැම්බර් 14**

ජනවාරි 26 වන දා පැවැත්වෙන ජනාධිපතිවරනය ඉලක්ක කොට ගෙන සිදු වන වත්මන් උද්ඝෝෂන ව්‍යාපාරයේ දී ශ්‍රී ලංකාවේ වතු සමිති ඉටු කරන කාර්ය භාරයෙන් ඒවායේ කම්කරු පන්ති විරෝධී ස්වභාවය අවධාරනය වී ඇත. තේ, රබර් සහ පොල් වතු කම්කරුවන් 500,000ක් පමන නියෝජනය කරන මෙම සමිති, දැනට ජනාධිපති තනතුර දරන මහින්ද රාජපක්ෂ හෝ ඔහුගේ ප්‍රධාන ප්‍රතිවාදියා වන ජනරාල් සරත් ෆොන්සේකා යන ප්‍රධාන පාලක පන්තික අපේක්ෂකයන් දෙදෙනාගෙන් කෙනෙකුට සහාය දෙමින් සිටී.

මැයි මාසයේ දී බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය පරාජයට පත් වීමෙන් නිම වූ ඊට එරෙහි වාර්ගික යුද්ධය අනුකම්පා විරහිත අයුරින් කර ගෙන යාම සම්බන්ධයෙන් දෙදෙනා ම වගකිව යුතු ය. රාජපක්ෂ 2006 මැද දී යුද්ධය යලි දියත් කල අතර, එය කර ගෙන ගියේ පසු ගිය මාසය තෙක් ශ්‍රී ලංකාවේ අග්‍ර ජනරාල්වරයාව සිටි ෆොන්සේකා ය. යුද්ධයේ අවසන් මාසවල දී එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශවලට වග විභාගයක් නැතිව මිලිටරිය හෙලූ බෝම්බවලින් සිවිල් වැසියෝ දහස් ගනනක් මරු දුටහ.

එල්ටීටීඊයට එරෙහි යුද්ධය කම්කරුවන්ගේ ආර්ථික ඉල්ලීම් සහ කාර්මික ක්‍රියාවන් ක්‍රමානුකූලව මර්දනය කිරීමක් සමග සම්පාත විය. 2006 දී ප්‍රධාන වශයෙන් ම දෙමල කතා කරන සියදහස් ගනනක් වතු කම්කරුවන් වැඩ වර්ජන ක්‍රියාවට පිවිසි විට, යුද ප්‍රයත්නයට වල කපන්නේ යැයි කියමින් ජනාධිපති රාජපක්ෂ ඔවුන්ට චෝදනා කලේ ය. සියලු කාර්මික ක්‍රියාවන් කඩිනමින් නවතා දැමූ වතු සමිති දරිද්‍රතා රේඛාවේ මට්ටමට සමාන වැටුප් සැකැස්මක් පිලිගත්තේ ය.

මෙම වසරේ දී ද, ආන්ඩුවේ සහ හාම්පුතුන්ගේ ඉල්ලීම් පැටවීමේ දී සමිති ඊට සමාන කාර්ය භාරයක් ඉටු කලේ ය. යුද්ධය අවසන් වුව ද "ජාතිය ගොඩ නැගීම" උදෙසා කම්කරුවන්ට දිගට ම කැප වීමට සිදු වන බව රාජපක්ෂ අවධාරනය කලේ ය. ලංකා කම්කරු කොන්ග්‍රසය (සීඩබ්ලිව්සී) සහ එහි මිත්‍ර පාක්ෂිකයෝ, සාමාජික අදහස් නො විමසා, සැප්තැම්බරයේ දී ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය (සීඊඑෆ්) සමග රුපියල් 405ක (එ.ජ. ඩොලර් 3.50ක) දෛනික වැටුපක් සඳහා වූ ගිවිසුමකට අත්සන් කලහ.

කම්කරුවන් අතර පුලුල් ලෙස කෝපය පැතිර ගිය තතු තුල, කඳුරට ජනතා පෙරමුන (යූපීඑෆ්) සහ වෙනත් සමිති කිහිපයක් ද්‍රෝහී පාවා දීමේ විරුද්ධවාදීන් ලෙස වෙස් පෑහ. එහෙත් කවර හෝ කාර්මික ක්‍රියාවකට පිවිසීම හිතාමතා සති ගනනාවක් තිස්සේ පමා කල ඔවුහු, අනතුරුව පමා වූවා වැඩි යැයි කියමින් උද්ඝෝෂනයකට මුල පිරීම ප්‍රතික්ෂේප කලහ.

දැන් එම සමිති ම, තම අපේක්ෂකයා කම්කරු හිතෛෂී ය, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ගැන උත්සුක ය යන මායාව ප්‍රවර්ධනය කරමින් රාජපක්ෂ හෝ ෆොන්සේකා පසුපස පෙල ගැසෙමින් සිටී. දේශපාලන පක්ෂයකට අනුබද්ධ වී හෝ ඍජුව ම දේශපාලන පක්ෂයක් ලෙස ක්‍රියා කරමින් හෝ සිටින මෙම සමිති සියල්ල, ජය ගන්නා අපේක්ෂකයාගෙන් යම් මිල ගෙවීමක් අපේක්ෂා කරති. සීඩබ්ලිව්සී සහ යූපීඑෆ් නායකයෝ දැනටත් රාජපක්ෂ ආන්ඩුවේ ඇමතිවරුය.

ආරුමුගම් තොන්ඩමාන් සහ මුතු සිවලිංගම් ඇතුලු සීඩබ්ලිව්සී නායකයෝ තමන් රාජපක්ෂට සහාය දෙන බව නිවේදනය කිරීමට දෙසැම්බර් මස මුල දී පුවත්පත් සාකච්ඡාවක් පැවැත්වූහ. තොන්ඩමාන් වතු යටිතල පහසුකම් ඇමති වන අතර සිවලිංගම් ඔහුගේ නියෝජ්‍ය ඇමති ය.

"වතු ප්‍රජාවේ ජීවන තත්ත්වයන් වැඩි දියුනු කිරීමට වෙහෙස නො බලා ඔහු දරන ප්‍රයත්නයන්" සම්බන්ධයෙන් සිවලිංගම් රාජපක්ෂට ප්‍රශංසා වැසි වැස්සූහ. "අධ්‍යාපනය, නිවාස පිලිබඳ සුභසාධනය,

යටිතල පහසුකම් යන ක්ෂේත්‍රවල දී" කම්කරුවන්ට "බොහෝ දේවල් දිනා ගත හැකි" වූ බව ඔහු කී ය.

මෙම සියලු කියා පෑම් මුලුමනින් ම මුසාවාදී ය. බහුතරයක් වතු කම්කරුවෝ බ්‍රිතාන්‍ය විජිත පාලන සමයේ දී ගොඩ නැගූ තදබද වූ ලයින් කාමරවල තව මත් ජීවත් වෙති. බොහෝ දෙනාට නල ජලය සහ විදුලි බලය වැනි මූලික පහසුකම් නැත. වතුවල පවත්නා පාසල් සහ වෛද්‍ය මධ්‍යස්ථාන දැඩි කාර්ය මාන්ඩලික සහ සම්පත් හිඟයකින් පෙලේ. මෑත ම වැටුප් සැකැස්ම, 2007 සිට පැවත එන සියයට 55 ජීවන වියදම් දීමනාවට වඩා බෙහෙවින් පහල තැනක වැටුප රඳවා තබනවා පමනක් නො වේ, එය නිෂ්පාදනය ඉහල දැමීම සඳහා සැලසුම් කල කොන්දේසි ද පනවයි.

වතු සමිතිවල අවස්ථාවාදී ස්වභාවය ද විදහා දැක්වින. "අප දැන් ආන්ඩුවේ අපේක්ෂකයාට කොන්දේසි විරහිතව සහාය දෙනවා," සිවලිංගම් කී ය. "ඒත් ජනරාල් ෆොන්සේකා දිනුවොත් අප ඔහුගේ ආන්ඩුවට එකතු වෙන එක ගැන හිතල බලනවා. ඒක එදාට බලමුකො." අනෙක් සමිති සියල්ල උනන්දු වූයේ සාකච්ඡාවෙහි යෙදීම ගැන යැයි පවසමින්, 1977 දී පටන් සෑම අවස්ථාවක දී ම සීඩබ්ලිව්සීය කලාක් මෙන්, පවතින ආන්ඩුවට එක් වන්නට අසමත් වීම ගැන ඔහු ඒවාට දොස් කීවේ ය.

අනෙක් සමිතිවලින් බොහොමයක් දැන් පක්ෂ පිලිවෙත් උඩ පෙල ගැසෙමින් සිටී. ශ්‍රී ලංකා නිදහස් කම්කරු සමිතිය (එස්එල්එෆ්ඩබ්ලිව්යූ) රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සමග පෙල ගැසී සිටියි. ඒකාබද්ධ වතු වෘත්තීය සමිති මධ්‍යස්ථානයට (ජේපීටීයූසී) පාලක සන්ධානයේ කොටස්කරුවන් වන ලංකා සමසමාජ පක්ෂයේ (ලසසප) සහ ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂයේ (කොප) පාලනය යටතේ පවතින කුඩා සමිති දෙකක් ද ඇතුලත් ය. මෙම සමිති සියල්ල ම ආරම්භයේ පටන් ම සීඩබ්ලිව්සීයේ ද්‍රෝහී පාවා දීමට සහාය දුන් අතර, දැන් රාජපක්ෂට සහාය දෙමින් සිටියි.

ප්‍රධාන විරුද්ධ පක්ෂ දෙක වන එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ද ඔවුන්ගේ වඩා කුඩා පරිමාන මිත්‍ර පාක්ෂිකයෝ ද ජනරාල් ෆොන්සේකා "පොදු අපේක්ෂකයෙකු" හැටියට සලකා ඔහුගේ ඔජ වඩති. එජාපයට අනුබද්ධ ලංකා ජාතික වතු කම්කරු සංගමය (එල්ජේඊඩබ්ලිව්යූ) තව මත් ප්‍රකාශයක් කර නැති මුත් ෆොන්සේකාට සහාය දෙන බව නිසැක ය. ෆොන්සේකාගේ කතාවට සවන් දීමට සහ ඔහුගේ උද්ඝෝෂන ව්‍යාපාරය තර කිරීමට මෙම මස මුල දී පක්ෂ මූලස්ථානයට කැඳවුනු සමිති නිලධරයන් අතර ජවිපෙ සමග පෙල ගැසී සිටින සමස්ත ලංකා වතු කම්කරු සමිතියේ (ඒසීපීඩබ්ලිව්යූ) නායකයෝ ද සිටියහ.

යූපීඑෆ් නායක පී. චන්ද්‍රසේකරන් රාජපක්ෂගේ කැබිනෙට්ටුවේ ඇමතියෙකු වුව ද සමිතිය තව මත් සිය විකල්පයන් කිරා බලමින් සිටියි. දෙසැම්බර් 4 වන දා, චන්ද්‍රසේකරන් මාධ්‍යවලට මෙසේ කී යඃ "අප මධ්‍යස්ථව ඉන්නෙ නැහැ. ජනවාර්ගික ගැටලුවත් මුස්ලිම්වරුන් ඇතුලු සුලුතර කන්ඩායම්වල හැම ගැටලුවක් මත් විසඳාවි ය කියල අප විශ්වාස කරන අපේක්ෂකයාට අපේ සහාය දක්වනවා." යූපීඑෆ් සමිතිය, පසු ගිය සතියේ සිට මේ වන තෙක් ම, දිනන්නට වඩාත් ඉඩ ඇත්තේ කවුරුන් දැයි ද වඩා හොඳ මිල ගෙවීමක් කරනු ඇත්තේ කවුරුන් දැයි ද විසඳා ගන්නට උත්සාහ දරමින් සිටී.

ජාතික කම්කරු සංගමය (එන්යූඩබ්ලිව්) තරමක් වෙනස් පිලිවෙතක් වැලඳ ගනිමින් සිටියි. එජාපය නායකත්වය දෙන, ෆොන්සේකාට සහාය දක්වන එක්සත් ජාතික සන්ධානයට (යූඑන්එෆ්) එක් වී ඇති මුත්, එන්යූඩබ්ලිව් නායක පී. දිගම්බරම් තමන් දෙන සහායට පදනමක් වශයෙන් ජනරාල්වරයා වෙත ඉල්ලීම් දහයක් ඉදිරිපත් කර ඇත. එකී බඩු ලැයිස්තුවට, සියලු වතු කම්කරුවන්ට පුරවැසි අයිතිය, වැටුප් වැඩි කිරීම් සහ වඩා හොඳ නිවාස, සෞඛ්‍ය රැකවරනය සහ අධ්‍යාපනය ඇතුලත් ය. සමිති සටන් වැදීම ප්‍රතික්ෂේප කර ඇති සියලු ගැටලු, වතු කම්කරුවන් ලබා දෙන ඡන්දවලට හුවමාරුවක් වශයෙන් ෆොන්සේකාගෙන් උදුරා ගත හැකි යැයි දිගම්බරම් දැන් කියා සිටී.

කෙසේ වුව ද, ශ්‍රී ලාංකික ආර්ථිකය පවතින්නේ, ගෝලීය අවපාතයේ බලපෑම ද වසර ගනනාවක් තිස්සේ දැවැන්ත ආරක්ෂක වියදම් දැරීමේ ද ප්‍රතිඵලයක් ලෙස වඩා නරක අතට හැරෙමින් තිබෙන අර්බුදයක ය. ජූලි මාසයේ දී, රජයේ වියදම් අධික ලෙස කපා හැරීම ද ඇතුලත් දැඩි කොන්දේසි පනවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලබා දුන් ඩොලර් බිලියන 2.6ක නයක් භාර ගන්නට ආන්ඩුවට බල කෙරින. 2010 අයවැය කල් දමමින් රාජපක්ෂ මෙම වැඩ පිලිවෙලවල් පමා කර ඇති මුත්, කුමන අපේක්ෂකයා ජය ගත්ත ද, මැතිවරනය අවසන් වූ වහා ම වැඩ කරන ජනයාගේ ජීවන තත්ත්වයන්ට මහා ප්‍රහාරයක් දියත් වනු ඇත.

පාලක ප්‍රභූවේ ඇතැම් කොටස් ෆොන්සේකාට සහාය දෙන්නේ නිශ්චිත වශයෙන් ම එල්ටීටීඊයට එරෙහි යුද්ධය කර ගෙන යාම සම්බන්ධයෙන් ඔහු සතු සනාථ වූ අතීත වාර්තාව නිසයි. කිසිදු දේශපාලන පක්ෂයකට බැඳී නැති ජනරාල්වරයාට රාජ්‍ය යන්ත්‍රනය සමග, විශේෂයෙන් ම මිලිටරිය සමග ශක්තිමත් සබඳතා පවතින අතර, මහා ව්‍යාපාරිකයන්ගේ ආස්ථානයෙන් ගත් විට, එයින් ඔහු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පටි තද කර ගැනීමේ පිලිවෙත් පැටවීමට ද මතු වන කවර

විරුද්ධත්වයක් වුව මර්දනය කිරීමට ද සමත් පරමාදර්ශී පුද්ගලයා බවට පත් වේ. එහෙත් එන්යූඩබ්ලිව් සමිතිය ෆොන්සේකා කම්කරුවන්ට ඇහුම්කන් දෙනු ඇත යන මිථ්‍යාව ප්‍රවර්ධනය කරමින් සිටියි.

ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු කොන්ග්‍රසය (ඩීඩබ්ලිව්සී) ද සමාන කාර්ය භාරයක් ඉටු කරමින් සිටී. ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුනට ද නායකත්වය දෙන ඩීඩබ්ලිව්සී නායක මනෝ ගනේෂන් පසු ගිය සිව් වසර තිස්සේ ම මානව අයිතීන් ආරක්ෂා කරන්නෙකු ලෙස පෙනී සිටියේ ය. සිවිල් නිරීක්ෂන කමිටුව නිර්මානය කල ඔහු, අතුරුදන් කිරීම්, පැහැර ගෙන යාම් පිලිබඳව, විශේෂයෙන් ම බස්නාහිර පලාත තුල අධිකරනයෙන් බැහැරව සිදු වූ ඝාතන පිලිබඳව එය රැස් කල සාක්ෂ්‍ය පදනම් කර ගනිමින්, එම අපරාධවලට සහාය වීම ගැන ආරක්ෂක හමුදාවලට ප්‍රසිද්ධියේ චෝදනා කලේ ය.

මෙම යුද අපරාධ සම්බන්ධයෙන් ෆොන්සේකා හෙලා දකිනවා වෙනුවට, ගනේෂන් දැන් මැතිවරනයේ දී ඔහුට සහාය දෙමින් සිටී. දෙසැම්බර් 2 වන දා පැවති පුවත්පත් සාකච්ඡාවක දී හේ මෙසේ පහදා දුන්නේ ය: "ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුන තමන්ගේ අතීත මතභේද පැත්තකින් තියලා ජනාධිපති අපේක්ෂයා වශයෙන් සරත් ෆොන්සේකාට සහාය දෙනවා." එන්යූඩබ්ලිව් සමිතියට මෙන් ම ගනේෂන්ට ද, එකක් වත් ක්‍රියාත්මක කරන්නට ෆොන්සේකා නොකැමති වන ආකාරයේ, තමන්ගේ ම නියමයන් සහ කොන්දේසි ලැයිස්තුවක් තිබේ.

පසු ගිය වසරේ දී කැනඩාවෙහි පල වන නැෂනල් පෝස්ට් පුවත්පත හමුවේ ෆොන්සේකා කල, පුලුල් වාර්තාකරනයකට ලක් වූ සැඳහුම් නිසා ගනේෂන් තරමක් අපහසුවට පත්ව සිටී. ජනරාල්වරයා එහි දී මෙසේ පැවසී ය: "මේ රට අයිති සිංහලයන්ට ය කියලා මා දැඩිව විශ්වාස කරනවා." වෙනත් ප්‍රජාවන්ට "අපිත් එක්ක මේ රටේ ජීවත් වෙන්න පුලුවන්" යැයි ද ඔහු සඳහන් කලේ ය. "ඒත් සුලුතරයක් ය කියන බොරු හේතුව පදනම් කර ගෙන අනිසි දේවල් ඉල්ලන්න ඒ අය උත්සාහ නො කල යුතු යි." ජනරාල්වරයා කී දේවල් "වැරදි ලෙස උපුටා දක්වා ඇතැ"යි කී ගනේෂන්, පහසුවෙන් වර්ගවාදී සැඳහුම් ඉවත දැමී ය.

වතු සමිති ෆොන්සේකා සහ රාජපක්ෂ පසුපස දේශපාලනිකව පෙල ගැසීමෙන් අවධාරනය වන්නේ, කම්කරුවන් දේශපාලන සංස්ථාපිතයේ සියලු කන්ඩායම්වලින් මුලුමනින් ම බිඳී වෙන් වී ගැනීමේ ද සමාජවාදී ක්‍රියා මාර්ගයක පදනම මත ස්වාධීනව බලමුලු ගැන්වී ගැනීමේ ද අවශ්‍යතාව යි.

බැල්මොරාල් තේ වත්තේ කම්කරුවෝ, සැප්තැම්බරයේ දී සිදු වුනු වැටුප් පිලිබඳ ද්‍රෝහී පාවා දීමට විරුද්ධව මූලික අයිතීන් සහ ජීවන තත්ත්වයන් වෙනුවෙන් සටන් වැදීම සඳහා සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) දේශපාලනික සහාය ඇතිව ස්වාධීන ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවූහ. වැටුප් සැකැස්මට එරෙහිව මතු වන විරුද්ධත්වය මර්දනය කිරීමට උත්සාහ කල සියලු වෘත්තීය සමිති ඔවුන්ගේ ආස්ථානයට දැඩි ලෙස විරුද්ධ විය.

දැන් වඩා පුලුල් කම්කරු ස්තර එම අරගලයේ පාඩම් උකහා ගත යුතු ය. කම්කරු පන්තියේ අවශ්‍යතාවන් නියෝජනය කරමින් ජනාධිපතිවරනයට ඉදිරිපත් වන එක ම පක්ෂය සසපය යි. සසප අපේක්ෂක විජේ ඩයස් උත්සාහ කරමින් සිටින්නේ, සමාජවාදී ඉදිරි දර්ශනයකට සටන් වැදීම සඳහා කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක අවශ්‍යතාව පිලිබඳව හැකි පුලුල් ම සාකච්ඡාව ප්‍රවර්ධනය කර ගැනීමට යි. ඔහුගේ උද්ඝෝෂනයට සහාය දෙන ලෙස අපි කම්කරුවන්ගෙන් සහ තරුනයන්ගෙන් ඉල්ලමු.

© www.wsws.org